# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,201 - 2020 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා - 2020.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1816 |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1821 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1824 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 නොවැම්බර් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 නොවැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* www. documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - පොතුවිල්

රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණයේ නඩුකරයන්ට අදාළව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජසන්තක කිරීමට යටත් වූ හා හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් 2020.11.21 වැනි දින පෙ. ව. 9.30 සිට පොතුවිල් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙහි පහත සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් යමකට හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා පරීක්ෂා කළ හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදිනම ඉවත් කර ගත යුතු අතර මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

වෙන්දේසියේ දී භාණ්ඩ හා වාහන ඉල්ලුම් කරන්නන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතු ය.

එම්. එච්. මොහමඩ් රාෆි,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
පොතුවිල්.

පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.
2020 ඔක්තෝබර් මස 14 වැනි දින.

**පොතුවිල් දිසා/ මහෙස්ත්‍රාත් අධිකරණයේ 2020.11.21 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තිබෙන භාණ්ඩ විස්තරය**

| | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ගණන* |
|---|---|---|---|
| 1. | 27549 PC 2019 | හොන්ඩා 2800 භූමිතෙල් ජනකය | 1 |
| 2. | 27549 PC 2019 | ඉන්කෝ 1.5 විදුලි වතුර මෝටරය | 1 |
| 3. | 27549 PC 2019 | මෙකිටා ග්‍රයින්ඩරය | 1 |
| 4. | 27549 PC 2019 | ඉන්කෝ ඩ්‍රිල් | 1 |
| 5. | 27549 PC 2019 | ගල් විදින කටුව | 1 |
| 6. | 27549 PC 2019 | කල් කපන තල | 3 |
| 7. | 18144 WL 2014 | පා පැදි පොම්පය | 1 |
| 8. | 28518 WL 2020 | පා පැදි පොම්පය | 1 |
| 9. | 28242 WL 2020 | කුළු ගෙඩිය | 1 |
| 10. | 26651 PC 2019 | කුළුගෙඩිය | 1 |
| 11. | 28846 E 2020 | ගෑස් උදුන | 1 |
| 12. | 28846 E 2020 | සිලින්ඩරය | 1 |
| 13. | 28878 PC 2020 | සවල් | 1 |
| 14. | 28863 PC 2020 | සවල් | 1 |
| 15. | 28937 PC 2020 | සවල් | 1 |
| 16. | 28919 PC 2020 | සවල් | 1 |
| 17. | 27549 PC 2019 | පොරොව | 1 |
| 18. | 28914 F 2020 | උදළු | 1 |
| 19. | 28912 F 2020 | වල් කපන කැති | 1 |
| 20. | 13342 F 2020 | වල් කපන කැති | 1 |
| 21. | 26346 F 2012 | වල් කපන කැති | 1 |
| 22. | 21080 F 2015 | වල් කපන කැති | 1 |
| 23. | 21082 F 2015 | වල් කපන කැති | 1 |
| 24. | 21774 F 2016 | වල් කපන කැති | 1 |
| 25. | 22709 F 2017 | වල් කපන කැති | 1 |
| 26. | 23159 F 2017 | වල් කපන කැති | 1 |
| 27. | 23161 F 2017 | වල් කපන කැති | 1 |
| 28. | 23162 F 2017 | වල් කපන කැති | 1 |
| 29. | 23166 F 2017 | වල් කපන කැති | 1 |
| 30. | 23705 F 2017 | වල් කපන කැති | 1 |
| 31. | 23731 WL 2017 | වල් කපන කැති | 1 |
| 32. | 23821 F 2017 | වල් කපන කැති | 1 |
| 33. | 23824 F 2017 | වල් කපන කැති | 1 |
| 34. | 23986 F 2017 | වල් කපන කැති | 1 |
| 35. | 24133 F 2017 | වල් කපන කැති | 1 |
| 36. | 24379 F 2018 | වල් කපන කැති | 1 |
| 37. | 24404 PC 2018 | වල් කපන කැති | 1 |
| 38. | 24537 F 2018 | වල් කපන කැති | 1 |
| 39. | 24792 F 2018 | වල් කපන කැති | 1 |
| 40. | 24793 F 2018 | වල් කපන කැති | 1 |
| 41. | 25154 F 2018 | වල් කපන කැති | 1 |
| 42. | 25297 F 2018 | වල් කපන කැති | 1 |
| 43. | 25403 F 2018 | වල් කපන කැති | 1 |
| 44. | 25405 F 2014 | වල් කපන කැති | 1 |
| 45. | 19467 F 2019 | වල් කපන කැති | 1 |
| 46. | 26344 F 2016 | වල් කපන කැති | 1 |
| 47. | 28712 PC 2020 | බෙරල් | 1 |
| 49. | | හිස් බියර් ටින් | ගොඩවල් |
| 50. | | හිස් වීදුරු බෝතල් | ගොඩවල් |

ඉහත ද්‍රව්‍ය සමග ගංගා වැලි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඇති බව දන්වමි.

11-13

## මහෙස්ත්‍රාත් අධිකරණය - මඩකලපුව

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ නඩු විභාගවලදී රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ 2020.11.21 වැනි දින පෙරවරු 9.00 ට මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධියේ වෙන්දේසි කිරීමට නියමිතය.

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර් වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදුකරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළයුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිත් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
මඩකලපුව.

2020.10.14

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය

| අංක | නඩු අංකය | ලියාපදිංචි අංකය | භාණ්ඩ | අයිතම ගණන |
|---|---|---|---|---|
| 1. | AR/431/20 | EP QK - 0647 | ත්‍රීරෝද රථය | 01 |
| 2. | 58675/MT/19 | EP JI -9935 | යතුරු පැදිය | 01 |
| 3. | 59114/MT/19 | 147-6676 | යතුරුපැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 4. | 59312/MT/20 | EP HT - 9245 | යතුරුපැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 5. | 59594/MT/20 | EP BFG - 2253 | යතුරු පැදිය | 01 |
| 6. | 59725/MT/20 | EP GT - 4130 | යතුරු පැදිය | 01 |
| 7. | 59867/MT/20 | EP GV - 2612 | යතුරු පැදිය | 01 |
| 8. | 59869/MT/20 | EP HK - 5449 | යතුරු පැදිය | 01 |
| 9. | 60905/MT/20 | EP BEB - 5449 | යතුරු පැදිය | 01 |
| 10. | 60193/MT/20 | EP HZ - 0172 | යතුරු පැදිය | 01 |
| 11. | AR/431/20 | | පාපැදි | 01 |
| 12. | AR/431/20 | | පාපැදි | 01 |
| 13. | No Number | | පාපැදි | 01 |
| 14. | No Number | | පාපැදි | 01 |
| 15. | No Number | | පාපැදි | 01 |
| 16. | No Number | | පාපැදි | 01 |
| 17. | No Number | | පාපැදි | 01 |
| 18. | No Number | | පාපැදි | 01 |
| 19. | No Number | | පාපැදි | 01 |
| 20. | No Number | | පාපැදි | 01 |
| 21. | No Number | | පාපැදි | 01 |
| 22. | No Number | | පාපැදි | 01 |
| 23. | 62050/S/20 | | පාපැදි | 01 |
| 24. | 62051/S/20 | | පාපැදි | 01 |
| 25. | 62052/S/20 | | පාපැදි | 01 |
| 26. | 61678/S/20 | | සවල් | 01 |
| 27. | 61679/S/20 | | සවල් | 01 |
| 28. | 61942/S/20 | | සවල් | 01 |
| 29. | 61865/S/20 | | සවල් | 01 |
| 30. | 62040/S/20 | | සවල් | 01 |

11-07

---

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වැල්ලවාය

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වැල්ලවාය, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාල රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොපාන පහත සඳහන් නඩු භාණ්ඩ 2020.11.21 වැනි දින පෙ. ව. 10.00 අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. මෙහි වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නකු වේ නම්, ඒ පිළිබඳ වෙන්දේසි පත්වනු ලබන දින පෙ. ව. 9.30 සිට පෙ. ව. 10.00 දක්වා කාලය ඇතුලත ස්වකීය අයිතිවාසිකම් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භය පැය 1/2කට ප්‍රථම වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිලිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එදිනම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. සියලුම මිලදී ගැනීම් සඳහා වන ගෙවීම් ලංකාවේ වලංගු මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගැනීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් පිළිගත හැකි හැඳුනුම්පතක් අනිවාර්ය වේ.

07. වෙන්දේසි සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේනම්, වෙන්දේසිය පවත්වනු ලබන අවස්ථාවේ ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

මහේෂ් වාකිෂ්ඨ,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
වැල්ලවාය.

2020 ඔක්තෝබර් මස 19 වැනි දින.
වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

ප්‍රසිද්ධ නඩු භාණ්ඩ වෙන්දේසිය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය |
|---|---|---|
| 01. | 31628 | අංක වයි 26 යාන්ත්‍රික විදිනය<br>දිග අඩි 50 වායු පීඩන හෝස් එකක්<br>අඩි 2.5ක් වූ බෝර විදින කටු එකක්<br>කුළු ගෙඩි එකක් |
| 02. | ඒ.ආර්. 835/20 | නොකියා වර්ගයේ ජංගම දුරකථන දෙකක් |
| 03. | 19400 | ප්ලාස්ටික් බාල්දි දෙකක්<br>යකඩ තාච්චි එකක්<br>උදළු තුනක්<br>ඉල්ලංකුරු එකක්<br>අලවංගු එකක් |
| 04. | අංක රහිත (රාජ- (සන්තක කරන ලද) | තඹ තොගයක් |
| 05. | 23121 | ගෑස් ලිප හා සිලින්ඩරය |
| 06. | ඒ. ආර්. 983/20 | ලුමාලා වර්ගයේ පාපැදි එකක් |
| 07. | ඒ. ආර්. 982/20 | මවුන්ටන් වර්ගයේ පාපැදි එකක් |
| 08. | ඒ. ආර්. 1063/20 | හීරෝ රෝයල් වර්ගයේ පාපැදි එකක් |
| 09. | ඒ. ආර්. 1065/20 | මවුන්ටන් වර්ගයේ පාපැදි එකක් |
| 10. | ඒ. ආර්. 1064/20 | අංක 902292 දරන පාපැදි එකක් |
| 11. | ඒ. ආර්. 1396/20 | අංක 69531988 දරන පාපැදි එකක් |
| 12. | ඒ. ආර්. 750/20 | ලුමාලා වර්ගයේ පාපැදි එකක් |
| 13. | 86063 | මවුන්ටන් වර්ගයේ පපාදි එකක් |
| 14. | 56366 | හෙල්මට් එකක් |
| 15. | 13835 | පාපැදි එකක් |
| 16. | 33131 | උදළු එකක්<br>ROBY 20 K. L. 191210574 දරන HMPTG 207 හෝස් පවර් 05 වතුර මෝටර් එකක් රෙගියුලේටරය සහිත ගෑස් ලිප් එකක් සිලින්ඩර් එකක් |
| 17. | 31813 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් එකක් සිලින්ඩර් එකක් |
| 18. | 32331 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් එකක් සිලින්ඩර් එකක් |
| 19. | 29602 | ඇලුමිනියම් කල එකක්<br>මුට්ටි එකක් |
| 20. | 30594 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් එකක් සිලින්ඩර් එකක් |
| 21. | 33481 | මල්ටි ප්ලග් එකක් |
| 22. | 33517 | මුට්ටි දෙකක් |
| 23. | 32683 | ඇලුමිනියම් කල එකක්<br>බේසම් එකක් |
| 24. | 33031 | ඇලුමිනියම් කල එකක් |
| 25. | ඒ.ආර්. 1522/20 | සූර්ය කෝෂ පැනලය |
| 26. | 33690 | සවල් තුනක්<br>උදළු එකක් |
| 27. | 8660 | හෙල්මට් දෙකක් |
| 28. | 29426 | උදළු දෙකක්<br>තාච්චි එකක් |
| 29. | 27819 | යකඩ ඉනි එකක්<br>උදළු එකක්<br>යකඩ බාල්දි එකක් |
| 30. | 27654 | උදළු එකක්<br>බාල්දි එකක් |
| 31. | 7880 | සවල් එකක් |
| 32. | 34412 | කැති එකක් |
| 33. | 34413 | උදළු එකක් |
| 34. | 34414 | උදළු එකක් |
| 35. | 33265 | සවල් එකක් |
| 36. | 33848 | උදළු එකක් |
| 37. | 30149 | ගෑස් සිලින්ඩරය හා ලිප් එකක් |
| 38. | 33782 | සවල් එකක්<br>යකඩ බාල්දි එකක් |
| 39. | 24220 | 1/0.44 වයර් 14 M ක් 5 AMP ප්ලග් බේස් එකක්<br>ප්ලග් ටොප් එකක් |
| 40. | 34036 | කැති එකක් |
| 41. | 34035 | කැති එකක් |
| 42. | 34587 | කැති එකක් |
| 43. | ඒ. ආර්. 1062/20 | හෙල්මට් එකක් |
| 44. | 30835 | ඇලුමිනියම් කල එකක් |
| 45. | 30313 | ඉල්ලංකුරු එකක්<br>උදළු එකක් |
| 46. | රාජසන්තක කරන ලද | බූලි තොගයක් |
| 47. | රාජසන්තක කරන ලද | බැරල් තොගයක් |

11-155

### දිසා මහේස්ත්‍රාත් අධිකරණය වරකාපොල

මෙම අධිකරණයේ පැවති නඩුවලට අදාළ රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද හා අධිකරණ ගොඩනැගිලිවලින් ඉවත් කරන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2020 නොවැම්බර් මස 21 වැනි දින පෙ.ව 10.00 අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩ පිළිබඳ හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටීනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙ.ව. 9.30 ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතුය.

රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද සෞඛ්‍ය විධිවිධාන අනුකූලව වෙන්දේසිය සඳහා සහභාගි විය යුතුය.

වෙන්දේසිය පැවැත්වෙන දින පෙ.ව 8.30 සිට 9.30 දක්වා තුල මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසර ලබා ගෙන භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසියේදී මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේදීම මුදලින් පමණක් ගෙවීම් කළ යුතුය. චෙක්පත් මුදල් ඇණවුම් හා බැංකු අණකර භාරගනු නොලැබේ.

වෙන්දේසිය පිළිබඳ කරනු ලබන පැමිණිලි චෝදනා වෙන්දේසිය අවසන් වූ වහාම ඉදිරිපත් කළ යුතු අතර පසුව කරනු ලබන පැමිණිලි කිසිවක් බාරගනු නොලැබේ.

වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ එදින ප.ව. 3.30ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

බුවනෙක රාජකරුණා,
දිසා විනිසුරු,
වරකාපොල.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
වරකාපොල දිසා/මහේස්ත්‍රාත් අධිකරණයේ දීය.

### භාණ්ඩ ලේඛනය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01 | 1920 | ගෑස්සිලින්ඩරය, ගෑස්ලිප |
| 02 | 2094 | ගෑස්සිලින්ඩරය, ගෑස්ලිප |
| 03 | 2548 | පැදුරු 01 යි |
| 04 | 1946 | ගෑස්සිලින්ඩරය, ගෑස්ලිප |
| 05 | 1165 | ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 06 | 1079 | නිල්පාට ප්ලාස්ටික් බැරල් 02 යි, ගෑස්ලිප |
| 07 | 1140 | ගෑස් සිලින්ඩරය, ගෑස් ලිප් 01 |
| 08 | 1127 | කම්බි දෙකයි |
| 09 | 946 | වතුර මෝටරය, උදැල්ල, වතුර බටය, වයරය |
| 10 | 2109 | කාපට් පැදුරු 01යි |
| 11 | 2093 | පැදුරු 01යි |
| 12 | 307 | ප්ලාස්ටික් පැදුරු 01යි |
| 13 | 2944 | ගෑස් සිලින්ඩරය හා ගෑස් ලිප් 01 යි |

### අධිකරණ ගොඩනැගිලිවලින් ඉවත් කරන ලද ද්‍රව්‍ය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 14 | | ලී කැබලි |
| 15 | | කොමඩ් 01යි |
| 16 | | සින්ක් 01 යි |
| 17 | | ලී ජනේල සහ දොරවල් (යකඩ ග්‍රිල් සහ සරනේරු සමඟ) |

### වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද ද්‍රව්‍ය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 18 | | මුදල් පෙට්ටි 01 යි |
| 19 | | වීසි කැති 01 යි |
| 20 | | සිටුවන විදුලි පංකා 01යි |
| 21 | | උදලු 02 යි |
| 22 | | පුටු සාමාන්‍ය 06 යි |
| 23 | | පුටු ඇඳි සහිත 07 යි |

11-117

---

### මහෙස්ත්‍රාත් අධිකරණය - බිබිල

### රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණ නඩුකරයන්ට අදාලව නඩු භාණ්ඩ ලෙස ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍යයන් අතරින් රාජසන්තක කිරීමට යටත් වූ හිමිකම් නොපෑ පහත සඳහන් ද්‍රව්‍යයන් 2020 නොවැම්බර් මස 14 වැනි දින පෙ. ව. 9.00 සිට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

02. මෙහි සඳහන් නඩු භාණ්ඩ අතරින් යමකට හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය දින වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසියට ඉදිරිපත් කර ඇති ද්‍රව්‍ය වෙන්දේසි දින දී වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙරාතුව අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබාගෙන පරීක්ෂා කිරීමට කටයුතු කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළි නොගෙනෙන අවස්ථාවක දී අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එකී අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් එදින පස්වරු 4.00 ට පෙර ඉවත් කර ගත යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

06. භාණ්ඩ වෙන්දේසියේ දී භාණ්ඩ ඉල්ලුම්කරන්නන් සිය අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා සහතික පත්‍රයක් ඉදිරිපත් කිරීමට වග බලා ගත යුතු ය.

මහෙස්ත්‍රාත්,
චතුර ප්‍රසන්න අමරතුංග,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බිබිල.

2020 ඔක්තෝබර් මස 27 වැනි දින,
බිබිල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**තක්සේරු වාර්තාව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ පිළිබඳ විස්තරය* | *තක්සේරු මිල රු.* |
|---|---|---|---|
| 01. | විවිධ නඩු අංකයන්ට අදාළ | උදළු 30යි | 05 ක කොටසක් රු. 100 බැගින් |
| 02. | විවිධ නඩු අංකයන්ට අදාළ | සවල් 04 | 04 කොටසක් රු. 800 බැගින් |
| 03. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොරොව 05යි | 05 කොටසක් රු. 500 |
| 04. | විවිධ නඩු අංකයන්ට අදාළ | කැට කුඩ 11යි | 11 කොටසක් රු. 100 |
| 05. | විවිධ නඩු අංකයන්ට අදාළ | ගැරුම් වට්ටි 06යි | 06 කොටසක් රු. 150 |
| 06. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි වැලි බාල්දි 05යි | 05 කොටසක් රු. 500 |
| | | ලොකු වැලි බාල්දි 01යි | රු. 150 |
| 07. | විවිධ නඩු අංකයන්ට අදාළ | ලොකු ප්ලාස්ටික් බැරල් 02යි | 01ක් රු. 500 |
| 08. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි ප්ලාස්ටික් බැරල් 02යි | 01ක් රු. 250 |
| 09. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඇඳුම් උදලු 03යි | 01ක් රු. 500 බැගින් |
| 10. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි සින්තා පැදුරු 01යි | රු. 50 |
| 11. | විවිධ නඩු අංකයන්ට අදාළ | කැති 08යි | 08 කොටසක් 500 |
| 12. | විවිධ නඩු අංකයන්ට අදාළ | කුලු ගෙඩි 01යි | රු. 300 |
| 13. | විවිධ නඩු අංකයන්ට අදාළ | ඉල්ලංකුරු 03යි | 03 කොටසක් 200 |
| 14. | විවිධ නඩු අංකයන්ට අදාළ | අලවංගු 05යි | 05 කොටසක් 1,000 |
| 15. | විවිධ නඩු අංකයන්ට අදාළ | බන්ඩි කියත් 02යි | 01ක් 150 |
| 16. | විවිධ නඩු අංකයන්ට අදාළ | අත් කියත් 01යි | රු. 150 |
| 17. | විවිධ නඩු අංකයන්ට අදාළ | හෙල්මට් 01යි | රු. 50 |
| 18. | විවිධ නඩු අංකයන්ට අදාළ | යතුකැටය, නියන 01යි | රු. 50 |
| 19. | විවිධ නඩු අංකයන්ට අදාළ | ගල් විදින කටු 01යි | රු. 50 |
| 20. | විවිධ නඩු අංකයන්ට අදාළ | පොඩි බඟල් 01යි | රු. 50 |
| 21. | විවිධ නඩු අංකයන්ට අදාළ | සීලිං ලයිට් 02යි | රු. 150 |
| 22. | විවිධ නඩු අංකයන්ට අදාළ | වැලි කියුබ් 13 | ප්‍රාදේශීය මිළ කමිටු වාර්තාව අනුව |
| 23. | 44746 නඩුවට අදාළව | 12.05kg ගෑස් සිලින්ඩර් 01යි/පො ගෑස් ලිප් 01යි | රු. 1,500 |
| 24. | 44575 නඩුවට අදාළව | 12.05 kg ගෑස් සිලින්ඩර් 01යි/ ගෑස් ලිප් 01යි | රු. 2,000 |

11-170

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කුලීගොඩ, අඳුරන්ගොඩ, අංක 349/බී දරන ස්ථානයේ පදිංචි මුතුවාහන්දි උෂාන්ත කුමාර සහ පමුණුගම, සෙත්තප්පාඩුව, අංක 96/3 දරන ස්ථානයේ පදිංචි අදිකාරි මුදියන්සේලාගේ නලීනා ජානි ප්‍රසිඩා ප්‍රනාන්දු වන අප විසින් කුලීගොඩ, අඳුරන්ගොඩ අංක 349/බී දරන ස්ථානයේ පදිංචි මුතුවාහන්දි තුෂාන්ත කුමාර වෙත ප්‍රදනය කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් ටී. පී. ගෝතමී මහත්මිය විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2020.01.16 වන දිනැති අංක 2602 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවකට සහ පියවර වලට අප වගකියනු නොලැබේ.

මුතුවාහන්දි උෂාන්ත කුමාර,
සහ
අදිකාරි මුදියන්සේලාගේ නලීනා ජානි ප්‍රසිඩා ප්‍රනාන්දු

2020 ඔක්තෝබර් මස 12 වැනි දින දී ය.

11-11

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ඉරාසනායහම් පාර, එල්ලයිනහර් ඒරාවූර් - 04, මඩකලපුව යන ලිපිනයේ පදිංචි පරමේස්වරි ඉලංකෝ (ජා. හැ. පත් අංක 577201617 V) යන අයට Bahn Strasse 99, 3008 Bern, Switzerland යන ලිපිනයේ පදිංචි සණ්මුහම් තවරාජා (ජා. හැ. පත් අංකය 685841827 V) යන අය විසින් Dr. Urs Fasel, notary public of the Canton of Berne (Switzerland), with offices at Berne යන අය විසින් 2012.03.07 වැනි දින සහතික කර පරමේස්වරි ඉලංකෝ යන අයට ලබා දී ඇති මඩකලපුව නැගෙනහිර කළාප රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවෙන් 2012.06.14 වැනි දින 364 වැනි අනු අංකයේ 82 වැනි පොතේහි 20 වැනි පිටුවේ සටහන් කරන ලද්දවූ විශේෂ ඇටෝර්නි බලය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා රජයට ද, එකී මහජනතාවට ද දන්වා සිටිමි. මින් ඉදිරියේදී මෙම පුද්ගලයා විසින් කරනු ලබන ක්‍රියා කාරකම් කිසිවකටත් මම වග නොකියන බව ද මෙයින් දන්වා සිටිමි.

සණ්මුහම් තවරාජා.

11-20

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : අයි. ජී. එම්. ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00228210
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : කරල්දෑක්ම, බුලත්සිංහල
ලියාපදිංචි කළ දිනය : 2020.09.29

සමාගම් ලේකම්.

11-37

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය ප්‍රකාරව 2019 ක් වූ දෙසැම්බර් මස 18 වැනි දින සංස්ථාපනය කරන ලද සමාගම පිළිබඳව මහජනයා වෙත කෙරෙන දැනුම් දීමයි.

සමාගමේ නාමය : සුපර්වලු ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 00218497
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : #231, ප්‍රධාන වීදිය, කැකිරාව.

සිලෝන් කෝපරේට් අෆෙයාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

11-41

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව 2020 ක් වූ මාර්තු මස 02 වැනි දින සංස්ථාපනය කරන ලද සමාගම පිළිබඳව මහජනයා වෙත කෙරෙන දැනුම් දීමයි.

සමාගමේ නාමය : නේෂන් ඒයිඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීජ් 00220914
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : #155, ඩොක්යාඩ් පාර,
ත්‍රිකුණාමලය.

සිලෝන් කෝපරේට් අෆෙයාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

11-42

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

නෙදර්ලන්තයේ 1213 NL හිල්වර්සම් කොලොසියම් 1 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 1 වර්ල්ඩ් ට්‍රේඩ් සෙන්ටර් බටහිර කුළුනේ (Wet Tower) 35 වන තලයේ පිහිටි ශාඛා කාර්යාලය (ලියාපදිංචි අංක FC 1102 ලියාපදිංචි කර ඇති) නෙදර්ලන්තයේ නිසි පරිදි ලියාපදිංචි කළ සමාගමක් වන නයිකී 360 හෝල්ඩින් බී. වී. (Nike 360 Holding B. V.) (ලියාපදිංචි අංක 32152659) අධ්‍යක්ෂවරයෙකු වන දැනට නෙදර්ලන්තයේ 1077 VC ඇම්ස්ටර්ඩෑම් හි හෝල්බෙයින්ස්ට්‍රාට් (Holbeinstraat) 31 හි ඩැනියෙල් විලියම් මැක්කෙන්සී (Daniel William Mckenzie) වන මා විසින් ශ්‍රී ලංකාවේ කොළඹ 07 ග්‍රෙගරි පාරේ අංක 8/6 හි මයිකල් ක්‍රිස්ටියන් ස්ටීන් (Michael Kristian Steen) හට ප්‍රදානය කරන ලද 2019 අප්‍රේල් මස 15 වන දිනැති නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් හි සිවිල් නීති නොතාරිස් ජැන් පියෙට් වැන් හර්සෙලර් (Jan Piet Van Harseler) ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2020 සැප්තැම්බර් මස 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබූ බව එකී ජනරජයේ මහජනතාව සහ ආණ්ඩුව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩැනියෙල් විලියම් මැක්කෙන්සී.
(Daniel William Mckenzie)

11-92

---

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඇමරිකා එක්සත් ජනපදයේ, සින්සින්නැටි (Cincinnati) OH 45202, රෝසා පාක්ස් වීදියේ අංක 191හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ 02, බ්‍රේබෲක් පෙදෙස, අංක 114- 110 හි පිහිටි ශාඛා කාර්යාලය (ලියාපදිංචි අංක N (F) 484) ලියාපදිංචි කර ඇති, ඇමරිකා එක්සත් ජනපදයේ ඩෙලවෙයාර් (Delaware) රජ්‍යයේ නිසි පරිදි සංස්ථාපනය කරන ලද ජෙනරල් ඉලෙක්ට්‍රික් ඉන්ටර්නැෂනල් අයිඑන්සී (General Electric International, Inc) (ලියාපදිංචි අංක 576003) හි උප සභාපති සහ ලේකම් වන දැනට ඇමරිකා එක්සත් ජනපදයේ සින්සින්නැටි (Cincinnati) OH 45202, රෝසා පාක්ස් වීදියේ අංක 191 හි වික්ටෝරියා විරෝන් (Victoria Vron) වන මා විසින්, කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක 315 හි ප්‍රයිස්වෝටර් හවුස්කූපර්ස් හි දයා සන්ජිත් වීරරත්න හට ප්‍රදනය කරන ලද 2000 ඔක්තෝබර් මස 31 වන දිනැති කනෙක්ටිකට් (Connecticut) රාජ්‍යයේ සහ ෆෙයාර්ෆීල්ඩ් (Fairfield) ප්‍රාන්තයේ ප්‍රසිද්ධ නොතාරිස් මේරි ඇන් ජෙන්ටිලේ ලොවිනේ (Maryann Gentile lovine) ලියා සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2020 ජූලි මස 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරනු ලැබූ බව එකී ජනරජයේ මහජනතාව සහ ආණ්ඩුව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

වික්ටෝරියා විරෝන්
(Victoria Vron)

11-93

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 08, පුංචි බොරැල්ල මරදන පාර, අංක 884 සහ දැනට සයිප්‍රස්, නිකෝෂියා, කයිමල්ඩ් අංක 29 ඒ හි පදිංචි ඔරුවලගේ ආශා ලසන්ති පෙරේරා වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මින් දැනුම් දෙන වගහැටි නම්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරි සහ ඇටෝර්නි බලපත්‍ර පොතේ 102 කාණ්ඩයේ 8096 පත් ඉරුවේ අංක 4569 දරන දින පොත් අංකය යටතේ 2016.12.08 දින ලියාපදිංචි කරන ලද 2016.11.21 දින ලියා අත්සන් තබන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් මා විසින් කුරුණෑගල, වදුරාගල, විල්බාව පාර, අංක 111/B හි පදිංචි ගජවීර ආරච්චිගේ ගයනි උපේක්ෂා පෙරේරා යන අය මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකාරිය වශයෙන් පත් කරන ලද එකී 2016.11.21 දිනැති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවටත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත්,

තවද, ඉහත කී ගජවීර ආරච්චිගේ ගයනි උපේක්ෂා පෙරේරා විසින් අද පටන් මා වෙනුවෙන් කරනු ලබන සියලු ක්‍රියාවන් වෙනුවෙන් මම වගකීමට යටත් නොවන බවට ද, මෙයින් දන්වා සිටිනු ලැබේ.

ඔරුවලගේ ආශා ලසන්ති පෙරේරා.

2020.11.06

11-95

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර, C. D. L. ප්‍රනාන්දු මාවතේ, අංක 35/110 දරන ස්ථානයෙහි පදිංචි ජීවන්ත දීප්ති ජයසේකර (ජාතික හැඳුනුම්පත් අංක 681150064 V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මින් දැනුම් දෙන වගහැටි නම්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරි සහ ඇටෝර්නි බලපත්‍ර පොතේ 08 කාණ්ඩයේ 65 පත් ඉරුවේ අංක 342 දරන දින පොත් අංකය යටතේ 2000.05.03 දින ලියාපදිංචි කරන ලද මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. විජේතිලක මහතා විසින් 2000.04.16 දින ලියා සහතික කරන ලද අංක 8303 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මා විසින් මාතලේ, විදුහල් පෙදෙසේ, අංක 19 සහ දැනට මහනුවර, C. D. L. ප්‍රනාන්දු මාවතේ, අංක 35/110 දරන ස්ථානයෙහි පදිංචි චම්පා කුමාරි ගමගේ (ජාතික හැඳුනුම්පත් අංක 197376302091) යන අය මාගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකාරිය වශයෙන් පත් කරන ලද එකී අංක 8303 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවටත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත්,

තවද, ඉහත කී චම්පා කුමාරි ගමගේ විසින් අද පටන් මා වෙනුවෙන් කරනු ලබන සියලු ක්‍රියාවන් වෙනුවෙන් මම වගකීමට යටත් නොවන බවට ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජීවන්ත දීප්ති ජයසේකර.

11-96

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ පිළියන්දල, බුද්ධාලෝක මාවත, අංක 61/1 හි පදිංචි අංක 613421157 V දරන ජාතික හැඳුනුම්පත හිමි ලමාහේවා නිශාන්ත ප්‍රියංකර වන මා විසින් පිළියන්දල, බුද්ධාලෝක මාවත, අංක 61/1 හි පදිංචි අංක 615480746 V දරන ජාතික හැඳුනුම්පත හිමි මද්දුමගේ දෝන සුජීවා ප්‍රිශාන්ති සෙනෙවිරත්න යන අය ඇටෝර්නි බලකාරිය වශයෙන් පත් කරන ලද ලඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 237 කාණ්ඩයේ 63 පත් ඉරුවේ 2078 දිනපොත් අංකය යටතේ ලියාපදිංචි කල බී. නිලූෂා දිල්මිණි ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා කොන්සල්වරිය විසින් 2019 මාර්තු මස 20 වැනි දින සහතික කරන ලද විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගේ කැමැත්ත පරිදි 2020 ඔක්තෝබර් මස 15 දින පටන් අවලංගු කරන ලබන බවත් එදිනෙන් පසු එකී ඇටෝර්නි බලපත්‍රය මත කරනු ලබන කිසිදු ක්‍රියාවක් වලංගු නොවන බවත් මෙයින් ශ්‍රී ලංකාවාදී සියලු දෙනා වෙත දන්වා සිටිමි.

ලමාහේවා නිශාන්ත ප්‍රියංකර.

11-97

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ පිළියන්දල, බුද්ධාලෝක මාවත, අංක 61/1 හි පදිංචි අංක 676560696 V දරන ජාතික හැඳුනුම්පත හිමි මද්දුමගේ දෝන නිලූකා ඉරාන්ති සෙනෙවිරත්න වන මා විසින් පිළියන්දල, බුද්ධාලෝක මාවත, අංක 61/1 හි පදිංචි අංක 615480746 V දරන ජාතික හැඳුනුම්පත හිමි මද්දුමගේ දෝන සුජීවා ප්‍රිශාන්ති සෙනෙවිරත්න යන අය ඇටෝර්නි බලකාරිය වශයෙන් පත් කරන ලද ලඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 236 කාණ්ඩයේ 36 පත් ඉරුවේ 1599 දිනපොත් අංකය යටතේ ලියාපදිංචි කල ඩග්ලස් සිරිවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2019 මාර්තු මස 15 වැනි දින සහතික කරන ලද අංක 14811 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගේ කැමැත්ත පරිදි 2020 ඔක්තෝබර් මස 15 දින පටන් අවලංගු කරන ලබන බවත් එදිනෙන් පසු එකී ඇටෝර්නි බලපත්‍රය මත කරනු ලබන කිසිදු ක්‍රියාවක් වලංගු නොවන බවත් මෙයින් ශ්‍රී ලංකාවාදී සියලු දෙනා වෙත දන්වා සිටිමි.

මද්දුමගේ දෝන නිලූකා ඉරාන්ති සෙනෙවිරත්න.

11-98

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : වීරා ට්‍රේඩිං (පීවීටී) ලිමිටඩ්
අංකය : පී වී 00229033
ලියාපදිංචි කළ දිනය : 2020.10.15
ලියාපදිංචි ලිපිනය : අංක 352, උගල්බඩ, කළුතර

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
නීතිඥ,
සමාගමේ ලේකම්,
වීරා ට්‍රේඩිං (පී වී ටී) ලිමිටඩ්.

11-124

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ටී. කේ. පී. හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 123022
ලියාපදිංචි කාර්යාලය : ලිවේකා ප්‍රින්ටර්ස් නො. 11, නැබඩ පාර, මතුගම
ලියාපදිංචි දිනය : 2017 ජුනි 12

ටී. කේ. පී. හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

11-129

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අපි 400072 - ඉන්දියාව මුම්බායි, සකිනාකා, ගුන්ඩෙවා ඔන්ක්ලේව්, 6 වන මහල B1/B2 හි ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ඇල්ෆ්‍රඩ් මැරිටයිම් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2019 ජූලි මස 04 වන දින සන්තෝෂ් මිශ්‍රා අද්වකාත් සහ ඉන්දියානු රජයේ නොතාරිස් මුම්බායි (මහාරාෂ්ට්‍රා) ඉදිරියේ කොළඹ 03, චාර්ල්ස් වේ (5 වන පටුමග වෙතින්) නො. 8/4 හි (දේශීය නියෝජිත) ඇල්ෆ්‍රඩ් මැරිටයිම් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කර තිබූ විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙහි සඳහන් දින සිට අවලංගු වී අහෝසි වන අතර එය බලපැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

ඇල්ෆ්‍රඩ් මැරිටයිම් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින දී ය.

11-132

**ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පිඑල්සි සමාගම, කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සි සමාගමට ඒකාබද්ධ කිරීම**

ඒකාබද්ධ කිරීමක් සිදු කරනු ලබන බවට ("ඒකාබද්ධ කරනු ලබන සමාගම") ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පිඑල්සී සමාගමේ (PB 445 PQ) සහ කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සී සමාගමේ (PB 269 PQ) අධ්‍යක්ෂ මණ්ඩල විසින් යෝජනා සම්මත කරගෙන ඇති අතර එකී ඒකාබද්ධ කිරීම මගින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 239 වන වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කරනු ලබන සමාගම කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සි සමාගම සමග ඒකාබද්ධ කරනු ලබන අතර කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සි සාමගම ඒකාබද්ධිත සමාගම වශයෙන් ක්‍රියා කරයි.

2007 අංක 07 දරන සමාගම් පනතේ 241 වන වගන්තියට අනුකූලව 2020 නොවැම්බර් මස 09 වැනි දින පවත්වනු ලබන අතිවිශේෂ මහා සභා රැස්වීමක දී සියලු සමාගම්වල කොටස් හිමියන් විසින් ඉහත කී ඒකාබද්ධ කිරීම අනුමත කිරීමට යටත් වේ.

ඒකාබද්ධ කිරීමේ යෝජනාව අනුමත කිරීම සඳහා එය කොටස් හිමියන් වෙත ඉදිරිපත් කරනු ලබන අතර එය අනුමත කරනු ලැබුවහොත් 2020 දෙසැම්බර් මස 31 වැනි දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පසු දිනයක සිට එය බලාත්මක වන්නේ ය.

සාමාන්‍ය ව්‍යාපාර වේලාවන් තුළ දී යම් කොටස් හිමියෙකු, සුරක්ෂිත ණයකරුවෙකු හෝ මහජනතාව විසින් පරීක්ෂා කර බැලීම සඳහා ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් කොළඹ 08, කිංසි පාරේ, අංක 165 දරන ස්ථානයේ පිහිටි කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සි සමාගමේ තබා ඇති අතර ඉල්ලා සිටීමේ දී ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් නොමිලයේ ලබාගත හැකි ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පිඑල්සි සමාගම
සමාගම් ලේකම්,

කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පිඑල්සි සමාගම,
සමාගම් ලේකම්

11-143

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ඩීඑෆ්සිසී බැන්ක් පී. එල්. සී.**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

ඉතා වටිනා සියළු පහසුකම් සහිත ව්‍යාපාරික දේපලක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ හිඟුරක්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව තුල අංක 29 මොරගස්වැව ග්‍රාම නිලධාරි වසම මොරගස්වැව ගමේ පිහිටි ගොඩ ඉඩම නමැති ඉඩමට බලයලත් මානක පී බී ඉලංගසිංහ විසින් 2013.08.01 වන දින සාදන ලද අංක 2013/PO/HG/42 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියළු දේ ඉඩමේ ප්‍රමාණය රූඩ් 02.

*දේපළට පිවිසීම*. - හබරණ නගරයේ සිට කදුරුවෙල පාරේ මීටර් 250ක් පමණ 26/2 බෝක්කුව දක්වා ගමන් ගෙන වමට පිහිටි ප්‍රාදේශීය සභා පාරට පිවිස එම පාරේ මීටර් 150ක් පමණ ගිය පසු මෙම පාරේ වම් පසින් පාරට මායිම්ව අදල දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ කදුරුවෙල වානා රිසෝට් යන නාමය විලාසය හා අභිධානය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන කදුරුවෙල පදිංචි කපුරුහාමිගේ ප්‍රේමසිරි කලුආරච්චි නොහොත් කපුරුහාමිගේ පේමසිරි කළුආරච්චි යන අය බන්ධනදයි වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පී එල් සී නමින් ප්‍රසිද්ධ නොතාරිස් සිරිපාල රණතුංග විසින් ලියා සහතික කරන ලද අංක 3074 දරන බැදුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කර ඇත.

2020 ක්වූ දෙසැම්බර් මස 03 වැනි දින ප. ව. 3.30 ට ඉහත විස්තර ඇති දේපළ කදුරුවෙල කෙලින් වීදිය අංක 626 දරන ස්ථානයේ පිහිටා ඇති ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී ශාඛා පරිශ්‍රයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා 2018.11.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද , 2018.11.13 වැනි දින දිවයින, දි අයිලන්ඩ් හා 2018.11.14 වැනි දින තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2500.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු නීති අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පී. එල්. සී. අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011 2371371.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

11-137

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. -කොඩිකාමම් ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යාපනය දිස්ත්‍රික්කයේ චාවකච්චේරි සුළුනගර සහා සීමාවන් හි වෝඩ් අංක 18 (ජේ 319) මීසාලේයි බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ මීසාලේයි ගමේ කාලිකෝවිල් පාරේ පිහිටි ''පැන්ට්‍රික්කර්නි'' නැමති ඉඩමට බලයලත් මානක එස් සර්වේස්වරන් විසින් 2014.06.07 වැනි දින සාදන ලද අංක 14128 දරන පිඹුරේ නිරූපිත බෙදු වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ.

ඉඩමේ ප්‍රමාණය : 01 එල්එම් එස් වීසී සහ 17 කුලිස්

මෙම දේපළ අගාෂ් ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - චාවකච්චේරි නගරයේ සිට ඒ 9 පාරේ කි. මී. 03ක් පමණ මීසාලේයි බටහිර දක්වා ගමන් ගෙන වමට හැරී කාලිකෝවිල් පාරට පිවිස එම පාරේ මීටර් 200ක් පමණ ගමන් ගත් පසු මෙම පාරේ දකුණු පසින් කාලිකෝවිල් පාරට මුහුණ ලා අදල දේපළ පිහිටා තිබේ.

2020 ක්වූ දෙසැම්බර් මස 04 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා 2018.01.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද , 2018.01.25 වැනි දින ලක්බිම, ඩේලිමිරර් හා තිනකුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 750.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වාණිජ අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී එල්. සී. අංක 479 ටී. බී. ජයා මාවත, කොළඹ 10

දුරකථන අංක : 011- 2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

11-136

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව කරුපයියා මොහාන් නොහොත් කරුප්පයියා මොහාන් යන අය ණයකරු වශයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. නමින් ප්‍රසිද්ධ නොතාරිස් කේ. පී. ද සිල්වා විසින් ලියා සහතික කරන ලද 2017 දෙසැම්බර් මස 29 වැනි දින අංක 2628 සහ 2018 පෙබරවාරි මස 26 වැනි දින අංක 2658 දරන උකස් බැදුම්කරයන් මගින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ 2020 ක් වූ දෙසැම්බර් මස 02 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල විස්තරය .-* ඌව පලාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදිකින්ද මහ පළාත කෝරළයේ බණ්ඩාරවෙල මහ නගර සභා සීමාව තුළ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නැගෙනහිර බණ්ඩාරවෙල ග්‍රාම නිලධාරි වසමේ බණ්ඩාරවෙල බදුල්ල පාරේ වරිපනම් අංක 327 දරන අස්වැද්දුම් පතන (T. P. 57816 හි කොටසක් වන) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් මැන සාදන ලද අංක BD/ 6879 සහ 2008.09.14 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙද වෙන් කළ බිම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි ඇතුළු අනෙකුත් සියළු දේ.

ඉඩමේ ප්‍රමාණය පර්චස් 20.72

*දේපළට පිවිසීම. -* බණ්ඩාරවෙල ප්‍රධාන ඔරලෝසු කණුව හන්දියේ සිට බදුල්ල පාරේ මීටර් 600ක් පමණ ගමන් ගත් විට ලිට්ල් ෆ්ලවර් කොන්වන්ට් පරිශ්‍රය දෙසට පිවිසෙන පාර හමුවේ. මෙම පාරට ඇතුළු වී එම පාරේ මීටර් 50ක් පමණ ගමන් ගත් පසු අදල දේපළ පාරේ දකුණු පසින් පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

අනෙකුත් තොරතුරු සඳහා විමසන්න : කළමනාකරු නීති අංශය, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අංක 242 යුනියන් පෙදෙස, කොළඹ 02.

දුරකථන අංක : 011- 4218742.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර.
දුරකථන අංක ජංගම : 071- 4 962 449/ 071 8 446 374

11-135

---

**අමානා බැන්ක් පී. එල්. සී. - ගම්පොළ ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අමානා බැන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව රොසියාන් ඉම්පෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදයි වශයෙන් අමානා බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේදී 2020 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල විස්තරය .-* ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ලියා පදිංචි කොට්ඨාසයේ අලුත්කුරු කෝරළේ දූනගහපත්තුවේ කට්ටුව ගමේ පිහිටි වරිපනම් අංක 922 දරන රුක්අත්තනගහ වත්ත පල්ලන්සේන කුරුදුවත්ත , කුරුදුවත්ත හෙවත් පල්ලන්සේන කුරුදුවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ අඩ්ගාර් ද සිල්වා විසින් සාදන ලද 1991.07.04 වැනි දින අංක 5091 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් ඒ දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 04 (හතරයි).

ඉහත කට්ටුව ගමේ පිහිටා ඇති ඉහත කී රුක්අත්තනගහ වත්ත පල්ලන්සේන කුරුදුවත්ත, කුරුදුවත්ත හෙවත් පල්ලන්සේන කුරුදුවත්ත නැමති ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද 2013.08.22 වැනි දින අංක 5504 ඒ දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 2 දරන ඉඩම් කොටස් හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 21. 4 (ඉඩමේ මුළු ප්‍රමාණය පර්චස් 25.4)

*දේපළට පිවිසීම.* - කොප්පරා හන්දියට ආසන්නව පිහිටි මීගමුව අමානා බැංකු ශාඛාව අසල සිට කොළඹ - හලාවත පාරේ හලාවත දෙසට කි. මී. 4.2ක් පමණ කි. මී. 34 කණුව දක්වා ගමන් ගත් විට අදාළ දේපළ මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2020.07.31 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2020.07.31 වැනි දින දිවයින, ඩේලිමිරර්, හා වීරකේසරී පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු සහ වෙනත් ගාස්තු ඇත්නම් එම මුදල,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් ගාස්තු,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත අමානා බැන්ක් පී එල් සී වෙත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු අමානා බැන්ක් පීඑල්සී, අංක 486 ගාලු පාර, කොළඹ 03.
දුරකථන අංක : 011- 7756000 දිගුව 2112.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර.
දුරකථන අංක : 081 - 2210595/071-8446374/071-4962449

11-134

---

## අමානා බැන්ක් පී. එල්. සී. - ගම්පොළ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අමානා බැන්ක් පී එල් සී අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව රොසියාන් ඉම්පෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායි වශයෙන් අමානා බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේදී **2020 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පෙ. ව. 10.00** ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල විස්තරය* .- ගම්පහ දිස්ත්‍රික්කයේ ජාඇල සහ කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ අංක 205 ඒකල කුරුදුවත්ත ග්‍රාම නිලධාරි වසම ඒකල කුරුදුවත්ත සහ කොටුගොඩ ගමේ 7වන පටුමග වරිපනම් අංක 11 දරන OTS ඉඩම නැමති ඉඩමට බලයලත් මානක එම්. ටී. රත්නායක විසින් සාදන ලද 2004.03.24 වැනි දින අංක 2132 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 146 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 18.32

*දේපළට පිවිසීම.* - ජාඇල හන්දියේ සිට මිනුවන්ගොඩ පාරේ කි. මී. 5.2ක් පමණ ගමන් ගෙන වමට හැරී මිලේනියම් සිටි නිවාස සංවර්ධන යෝජනා ක්‍රමය පාරට පිවිස එම පාරේ මීටර් 500ක් පමණ ගමන් ගෙන දකුණට හැරී එම පාරේ මීටර් 300ක් පමණ ගමන් ගත් පසු මිලේනියම් සිටි නිවාස යෝජනා ක්‍රමයට ඇතුළු වන ප්‍රධාන දොරටුවට පිවිස එම ප්‍රධාන පාරේ මීටර් 150 හෝ 160 ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළ මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2020.07.31 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද 2020.07.31 වැනි දින දිවයින, ඩේලිමිරර්, හා වීරකේසරී පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* .- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු සහ වෙනත් ගාස්තු ඇත්නම් එම මුදල,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් ගාස්තු,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත අමානා බැන්ක් පී එල් සී වෙත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු අමානා බැන්ක් පීඑල්සී, අංක 486 ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 7756000 දිගුව 2112.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර.
දුරකථන අංක : 081 - 2210595/071-8446374/071-4962449

11-133

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කොළඹ කොටුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ ගොඩිගමුව පදිංචි හේරත් මුදියන්සේලාගේ චමිලා දිල්රුක්ෂි යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004.04.28 දිනැති අංක 2004/130 සැලැස්මේ නිරූපණය වන නීලම්මහර පාර වරිපනම් අංක 128/10 දරන කෝන්ගහවත්ත සහ මීගහවත්ත නැමති ඉඩමේ ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004.03.03 දිනැති අංක 2004/70 සැලැස්මේ නිරූපණය වන ලොට් 2ඒ හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2004/130 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 9.50) විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම් උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය සහ මහරගම නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004.03.03 දිනැති අංක 2004/70 සැලැස්මේ නිරූපණය වන කෝන්ගහවත්ත සහ මීගහවත්ත නැමැති ඉඩමේ ලොට් 2 බී (පාර සඳහා වෙන්කිරීම) ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එච්. ඒ. ශාර්ගයිනෙවේල් විසින් සාදන ලද 1948.03.12 දිනැති සැලැස්මේ නිරූපනය වන ලොට් 2 හි නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2004/70 දරන සැලැස්ම අනුව පර්චස් හතයි දශම හතරයි අටක් ( අ. 0 රූ. 0 පර්. 07.48) නොහොත් හෙක්ටයාර් 0.0189 විශාල ඉඩම.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ ගොඩිගමුව පිහිටි බලයලත් මිනින්දෝරු නලීන් හේරත් විසින් සාදන ලද 2004.04.28 දිනැති අංක 2004/130 සැලැස්මේ නිරූපනය වන කෝන්ගහවත්ත සහ මීගහවත්ත නැමැති ඉඩමේ ලොට් ආර් 2 (අඩි 20ක් පළළ පාර සඳහා වෙන් කිරීම) සහ ලොට් ආර් 3 (අඩි 15ක් පළ පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2004/130 දරන සැලැස්ම අනුව පිළිවෙලින් පර්චස් දහසයයි දශම නවයයි එකක් සහ පර්චස් පහයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0 පර්. 16.91) සහ (අ. 0, රූ. 0 පර්. 05.70)ක් විශාල ඉඩම් කොටස්.

ඉහත සඳහන් දේපළ 2020 නොවැම්බර් මස 30 වැනි දින පෙරවරු 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ සිට හයිලෙවල් පාර ඔස්සේ මහරගම ඔරලෝසු කණුව මංසන්දිය දක්වා පැමිණ පිළියන්දල පාරට හැරෙන්න. එම පිළියන්දල මාර්ගය දිගේ තවත් කි. මී. 1 ක පමණ දුරක් ගොස් දකුණු පසට ඇති නීලම්මහර පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 850 ක පමණ දුරක් ගියවිට පිහිටි එලිෆන්ට් හවුස් පාරට හැරී තවත් මීටර් 80 ක පමණ දුරක් ගියවිට දකුණු පසට ඇති අතුරු මාර්ගයට හැරී මීටර් 10 ක පමණ දුරක් ගිය විට මාර්ග අවසානයේ අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2018.08.24 වැනි දින පළ වී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.08.21 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2018.08.21 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%(සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට, දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456465, 2456481.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොළොන්නාව,
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

11-128

---

## ඩී. එෆ්. සී. සී. බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. ඩී. රණගල විසින් ලියා සහතික කරන ලද 2018.08.28 දිනැති අංක 3103 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම පිටකෝට්ටේ දොන් සුදත් නිශාන්ත ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බලසීමාව ඇතුලත 522 පිටකෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිටකෝට්ටේ ගමේ පිහිටි පාගොඩ පාර වරිපනම් අංක 141/2 සහ 141/4 දරන කොට්ටනුවෙවත්ත (පහත වඩාත් විස්තර කරනු ලබන බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද 1962 මැයි මස 22 දිනැති අංක 770 දරන පිඹුරේ ලොට් 1 සහ 4 ඒකාබද්ධ කොට නැවත මැන සාදන ලද) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. කේ. එස්. බමුණුසිංහ විසින් මැන සාදන ලද 2018 ජුනි මස 15 දිනැති අංක 4861 දරන පිඹුරේ ලොට් එක්ස් වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඩම් කොටස එකී අංක 4861 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් දහ නවයයි දශම පහයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 19.50) හෙවත් හෙක්. 0.0493 ක් විශාල වූ ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි ඇතුලු වෙනත් සියලු දේ ද සමග වේ.

පහත විස්තර කරනු ලබන මාර්ගය සඳහා වූ වෙන් කිරීම උඩින් හා දිගේ වන මාර්ග අයිතිය ද සමග වේ:

බස්නාහිර පලාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල සීමාව ඇතුලත 522 පිටකෝට්ටේ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටකෝට්ටේ ගමේ පිහිටි කොට්ටනුවෙවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද 1962 මැයි මස 22 දිනැති අංක 770 දරන පිඹුරේ ලොට් 5 (පාරක් සඳහා වූ වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 770 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 0 පර්. 11.25) විශාල වූ ඉඩම වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් දේපළ **2020 නොවැම්බර් මස 25 වැනි දින පෙරවරු 10.00 ට** එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* - පිටකෝට්ටේ මංසන්ධියේ සිට පාගොඩ පාර ඔස්සේ මීටර් 200 ක් පමණ දුරක් ගිය විට (මාර්ගයේ දකුණු පසින් පිහිටි රෝයල් මින්කෝ පාසැලට යාබදව පිහිටි මාර්ගය) මාර්ගයේ දකුණු පසින් දේපළට පිවිසෙන මාර්ගය හමුවේ. එම මාර්ගය දිගේ මීටර් 50 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් එම මාර්ගය අවසානයේ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2020.03.13 වැනි දින පළ වී ඇති අතර, දිවයින, ද අයිලන්ඩ් යන පුවත්පත් වල 2020.02.28 සහ තිනක්කුරල් පුවත්පතේ 2020.03.02 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම වෙන්දේසිකරු වෙත පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%(සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500, 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට, දින 30ක් ඇතුළත ගෙවිය යුතු යි.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නීති අංශය, ඩී එෆ් සී සී බැන්ක් පීඑල්සී, අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02, දුරකථන අංක 011- 2371371.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

11-127

---

**සෙලාන් බැංකුව පීඑල්සී - අකුරැස්ස ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ විකිණීම

දෙදෙනාම, මාතර පදිංචි කනංකේ ආචාරිගේ මධුශංක සහ හේවා මුහන්දිරම්ගේ ඩන්ස්ටන් දයාරත්න යන අය බන්ධනදායි/උකස්කරු වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. එස්. විතානන්ද විසින් දෙකම සහතික කරන ලද 2015.10.20 දිනැති උකස් බැඳුම්කර අංක 1289 සහ 2016.03.24 දිනැති 1351 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් දේපළ,

**වර්ෂ 2020ක් වූ නොවැම්බර් මස 23 වැනි දින** පහත සඳහන් කර ඇති වේලාවන්හි දී දේපළ පිහිටි ස්ථානයේ දී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1 වන වෙන්දේසිය පෙ. ව. 11.00

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහ නගර සභා සීමාව තුළ, හිත්තැටිය නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හිත්තැටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 2010 ජුනි මස 18 දිනැති අංක 2010/86 සැලැස්මේ නිරූපනය වන මුදලින් ද පාර, වරිපනම් අංක 70/51 සහ 70/50 දරන ගොඩකදුරුගහවත්තේ ලොට් ඒ හි යාබද ලොට් 1 සහ 2 හි යාබද ලොට් ඒ බී සහ සී නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ. සමග ඉඩමේ ලොට් එක්ස් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම තුනයි පහක් (අ. 0 රූ. 0 පර්. 21.35) විශාල ඉඩම.

ඉහත සඳහන් ඉඩම උඩින් මාර්ග අයිතිය සමග

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහ නගර සභා සීමාව තුළ, හිත්තැටිය නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හිත්තැටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් සාදන ලද 2010 ජුනි මස 18 දිනැති අංක 2010/86 සැලැස්මේ නිරූපනය වන මුදලින් ද පාර, වරිපනම් අංක 70/51 සහ 70/50 දරන ගොඩකදුරුගහවත්තේ ලොට් ඒ හි යාබද ලොට් 1 සහ 2 හි යාබද ලොට් ඒ බී සහ සී නමැති ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් ඉසෙඩ් ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස, ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතයි හතරක් (අ. 0, රූ. 0, පර්. 4.74) විශාල ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. එස්. විතානන්ද විසින් සහතික කරන ලද 2015.10.20 දිනැති උකස් බැඳුම්කර අංක 1289 යටතේ උකස් කරන ලද දේපළ.

*දේපළට පිවිසීම.* - මාතර සිට හක්මන පාරෙන් හක්මන දෙසට 1.6km ක් පිනිදිය ඉන්ධන පිරවුම් හල දක්වා පැමිණ වමට ඇති හිත්තැටිය පාරෙන් 800 පැමිණ දකුණු දෙසින් ඇති මුදලින් ද මාවතෙන් (පන්සල පසුකරනවාත් සමග) 500m ගොස් දකුණට ඇති පාරෙන් 25m ක් ගොස් දකුණට මීටර් කිහිපයක් ගිය පසු එම පාරේ කෙලවරට වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

2 වන වෙන්දේසිය .- ප. ව. 2.00

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හිනිදුම පත්තුවේ උතුර ආදායම් කොට්ඨාසය තුළ, නෙළුව ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ (කලින් හිනිදුම උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ) පහල හිගුම් මඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, ගිගුම් මඩුව ගමේ පිහිටි අංක 482 දරන මිනුම්පති ගේ සැලැස්මේ නිරූපනය වන කැවුම් කුඹුරුහේන නමැති ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 183 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දහයයි පර්චස් දහසයයි (අ. 10, රූ. 0 පර්. 16) විශාල ඉඩම.

එකී අංක 1421 සැලැස්මේ සඳහන් ලොට් බී (ප්‍රාදේශීය සභා පාර) සහ එෆ්වීපී 482 හි සඳහන් ලොට් 184 (තවලම සිට නෙළුව ට යන පාර) තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඕ. එස්. විතානන්ද විසින් සහතික කරන ලද 2016.03.24 දිනැති උකස් බැඳුම්කර අංක 1351 යටතේ උකස් කරන ලද දේපළ

*දේපළට පිවිසීම.* - නෙළුව සිට ගාල්ල දෙසට 3.1km ක් කැවුම්කුඹුර හන්දිය දක්වා පැමිණ කැවුම්කුඹුර පාරෙන් 2.4km ගියපසු දකුණු පසින් වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2019.12.13 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ලංකාදීප, ඩේලි මිරර් පුවත්පත්හි 2019.12.09 දිනද, තිනක්කුරල් හි 2019.12.17 දින ද, සහ නිවැරදි කිරීම් ඩේලි මිරර් සහ ලංකාදීප පුවත්පත්හි 2019.12.19 සහ තිනක්කුරල් පුවත්පතෙහි 2019.12.20 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පලාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 1,000,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානි නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011- 2456485, 011- 2456479, 011- 2456473

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
උසාවි කොමසාරිස්.

අංක 09 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071 4318252 011- 2173282.

11-147

---

**සෙලාන් බැංකුව පීඑල්සී - තිස්සමහාරාමය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 09 වන වගන්තිය යටතේ විකිණීම

අම්බලන්තොට පදිංචි, විජේතුංග ලියනපටබැදිගෙයි ප්‍රදීප් ශාන්ත කුමාර යන අය බන්ධනදයි/උකස්කරු වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. පරනවිතාන විසින් දෙකම සහතික කරන ලද 2018.04.09 දිනැති බැඳුම්කර අංක 960 සහ 2018.04.10 දිනති 965 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයන්හි සඳහන් දේපළ වර්ෂ 2020ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පහත සඳහන් කර ඇති වේලාවන්හි දී දේපළ පිහිටි ස්ථානයේ දී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

1 වන වෙන්දේසිය පෙ. ව. 11.00

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර තුළ සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තුඩාව උතුර ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ, දෙල්කඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු යූ. ගුණවර්ධන විසින් සාදන ලද 1999.02.27 (වඩාත් නිවැරදිව 1999.03.04) වැනි දිනැති අංක 744 සැලැස්මේ නිරූපනය වන කුරුදුවත්ත පාර දිගේ තෙවරකඩුගේවත්ත හෙවත් තෙවරවඩුගේවත්ත හෙවත් දෙල්කඩවත්ත ලොට් බී හි ලොට් බී 3 නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කල බෙදාවෙන් කරන ලද ඉඩම් කොටස පර්චස් දහයයි දශම බිංදුවයි අටක් (අ. 0 රූ. 0 පර්. 10.08) නොහොත් හෙක්ටයාර් 0.02549ක් විශාල බිම ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඒ. ඒ. පත්ම කුමාර විසින් සාදන ලද 2017.10.28 දිනැති අංක 766 දරන මැතක මිනුම් සැලැස්මක් අනුව ලොට් 2 ලෙස වැඩිදුරටත් නිරූපනය කර ඇති අතර, ප්‍රමාණයෙන් පර්චස් නමයයි දශම හතයි හතරක් (අ. 0 රූ. 0 පර් .9.74) විශාල ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. පරනවිතාන විසින් සහතික කරන ලද 2018.04.03 දිනැති උකස් බැඳුම්කර අංක 960 යටතේ උකස් කරන ලද දේපළ වේ.

*දේපළට පිවිසීම*. - මාතර සිට හක්මන පාරෙන් හක්මන දෙසට 1km ක් ගොස් වමට ඇති හිත්තැටිය පාරෙන් 300m පැමිණ දකුණට ඇති කුරුදුවත්ත පාරෙන් කෙටි දුරක් ගියපසු දකුණු පසට වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

2 වන වෙන්දේසිය .- ප. ව. 2.00

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවා පත්තුවේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් සහ අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාව තුළ බෝලාන උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බෝලාන ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සාදන ලද 2005 ජූලි මස 06 දිනැති අංක 3830 සැලැස්මේ නිරූපනය වන ලොට් අංක බී දරන බෙදා වෙන්කරන ලද රජයේ ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයක් (අ. 0, රූ. 1 පර්. 10) විශාල බිම ගස්, වගා, ගොඩනැගිලි, සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත සඳහන් ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එච්. ධර්මදස විසින් සාදන ලද 2014.10.03 දිනැති අංක 4823 දරන මැතක මිනුම් සැලැස්මක ලොට් බී ලෙස වැඩිදුරටත් නිරූපනය කර ඇති අතර, ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයක් (අ. 0, රූ. 1, පර්. 10) විශාල ඉඩම.

ප්‍රසිද්ධ නොතාරිස් ජී. පී. පරනවිතාන විසින් සහතික කරන ලද 2018.04.10 දිනැති උකස් බැඳුම්කර අංක 965 යටතේ උකස් කරන ලද දේපල

*දේපළට පිවිසීම.* - අම්බලන්තොට ඔරලෝසු කණුව හන්දියේ සිට රිදියගම පාරෙන් රිදියගම දෙසට 5.1km ක් කොග්ගාල හන්දිය දක්වා පැමිණ දකුණු පසින් ඇති බෝලාන පාරෙන් 400km ගියපසු දකුණට ඇති ප්‍රාදේශීය සභා පාරෙන් 50m ගිය පසු වම් පසින් වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2019.12.13 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, ලංකාදීප, ඩේලි මිරර් පුවතපත්හි 2019.12.12 දින ද, තිනක්කුරල් හි 2019.12.20 දින ද, සහ නිවැරදි කිරීම් ඩේලි මිරර් සහ ලංකාදීප පුවත් පත්හි 2019.12.19 දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%,
(2) පලාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,500,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 1,000,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. අංශ ප්‍රධානි නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011- 2456485, 011- 2456479, 011- 2456473

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 09 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකතන අංක : 071 4318252 011- 2173282.

11-146

## සම්පත් බැංකුව පීඑල්සී
## (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. ආර්. එස්. යාපා සහ පී. එස්. යාපා.
ගිණුම් අංක : 1079 5755 1941.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.07.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි දහසය ලක්ෂ තිස් හතර දහස් අටයි ශත පනස් හතක (රු. 11,634,008.57) මුදල ද, 2019 ජූලි මස 02 වැනි දින සිට අංක 3753 සහ 5235 දරන බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි දොළොස් ලක්ෂ අසූ නම දහස් අටසිය විසි දෙකයි ශත අනූ හතක (රු. 11,289,822.97) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.09.12 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.09.03 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.12.15 වැනි දින පෙ.ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### *උපලේඛනය*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, උතුරු ගඟබොඩ පත්තුවේ, නාගොඩ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ අලුත්තනායම්ගොඩ අංක 214 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තනායම්ගොඩ පිහිටි "දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිඅච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. එල්. ඩබ්ලිව්. ගුණසේකර යන අය විසින් සාදන ලද 2007 මැයි මස 26 දාතම හා අංක 231 දරන පිඹුරේ සහ 2018 අප්‍රේල් මස 24 දාතම දරන පිටසන යන දෙකෙහිම නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලේගෙදරවත්ත නොහොත් අලුත්ගෙදරවත්ත, නැගෙනහිරට : ගිංගඟ හංගරමවත්ත නොහොත් ගඟඅද්දරවත්ත, මෙම ඉඩමේ ලොට් 3 සහ අංක 1687B දරන පිඹුරේ ලොට් 18 සහ ලොට් A4 (පාර), දකුණට : ලොට් 3 සහ අංක 1687B දරන පිඹුරේ ලොට් 9 සහ

ලොට් A4 (පාර) සහ බස්නාහිරට : වන්නිආරච්චිගේවත්ත සහ ලොට් A4 (පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් විසි පහයි දශම හතයි බිංදුවක් (A:0, R:3, P:25.70) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 231 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 128/42 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් A පහත සඳහන් යාබද ඉඩම්වල නැවත මිනුමක් සහ ඒකාබද්ධයකි :

1. එකී මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තනායම්ගොඩ පිහිටි " දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිඅච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1965 නොවැම්බර් මස 07 සහ 1966 මැයි මස 06 දාතම හා අංක 1687B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලේගෙදරවත්ත සහ ගිංගඟ, නැගෙනහිරට : ගිංගඟ, දකුණට : ලොට් A4 (පාර) සහ බස්නාහිරට : වන්නිආරච්චිගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් දහ හතරයි දශම හයයි තුනක් (A:0, R:2, P:14.63) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1687 B දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 54/101 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තනායම්ගොඩ පිහිටි " දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිඅච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1965 නොවැම්බර් මස 07 සහ 1966 මැයි මස 06 දාතම හා අංක 1687B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1, නැගෙනහිරට : ලොට් 1 සහ ගඟඅද්දරවත්ත, දකුණට : ගඟඅද්දරවත්ත සහ බස්නාහිරට : ලොට් 1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි තුනයි දශම පහයි හතක් (A:0, R:0, P:23.57) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1687B දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 24/187 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. එකී මාපල්ගම ග්‍රාමයේ ඉහළ අලුත්තනායම්ගොඩ පිහිටි " දුරගෙදර වත්ත නොහොත් පැලවත්ත වශයෙන් ද හඳුන්වනු ලබන වන්නිඅච්චිගේවත්ත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ජේ. නානායක්කාර යන අය විසින් සාදන ලද 1965 නොවැම්බර් මස 07 සහ 1966 මැයි මස 06 දාතම හා අංක 1687B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 8 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් A4 (පාර), නැගෙනහිරට : ලොට් 18 (පාර), දකුණට : ලොට් 9 සහ බස්නාහිරට : වන්නිආරච්චිගේවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි නමයයි දහම පහක් (A:0, R:0, P:29.5) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1687B දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 54/102 යටතේ ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

11-156

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එච්. එම් ඒ පී ජයරත්න සහ කේ අයි හෙට්ටිආරච්චි.
ගිණුම් අංක : 1140 5766 1194.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.07.30 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව හේරත් මුදියන්සේලාගේ අමිල ප්‍රසාද් ජයරත්න යන අය උකස්කරු වශයෙන් පැහැර ඇති හෙයින් ද, එකී අංක, 525 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවියයුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින්' රුපියල් එක් කෝටි විසිඑක් ලක්ෂ අසූ දහස් හයසිය අනූ හයයි ශත දෙකක (රු. 12,180,696.02) මුදල ක් 2020 ජූනි මස 25 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක් කෝටි විසි එක් ලක්ෂ අසූ දහස් හයසිය අනූ හයයි ශත දෙකක (රු. 12,180,696.02) මුදල ද, 2020 ජූනි 26 වැනි දින සිට අංක 525 දරන උකස් බැඳුම්කරය මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි දොළොස් ලක්ෂ එකොළොස් දහස් තුන්සිය අසූවයි ශත විසි නමයක (රු. 11,211,380/29) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනක් (13%) බැගින් වූ පොලිය ද දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ

සහ පරිශ්‍රයන් 2020.09.18 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.09.09 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.11.27 වැනි දින පෙ.ව. 10.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (වකේ උප කාර්යාලය) වකේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය කොට්ඨාසයේ සහ මිල්ලතේ - 386 ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ උඩගම ග්‍රාමයේ පිහිටි '' උඩුමුල්ලවත්ත'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස් එම් චන්ද්‍රසිරි යන අය විසින් සාදන ලද 2009 සැප්තැම්බර් මස 13 දාතම හා අංක 4066 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 20A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 18, නැගෙනහිරටː මෙම ඉඩමේ ලොට් 59 (පාර), දකුණට : මෙම ඉඩමේ ලොට් 23, බස්නාහිරට : සංඝමිත්ත විද්‍යාලයේ ඉඩම සහ මෙම ඉඩමේ ලොට් 18 යන මායිම්, තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දාහතරයි දශම පහක් (A :0 R:0 P:14.5) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ අංක 4066 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව G 59/03 යටතේ අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

11-157

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩී. ඩබ්ලිව්. සී. පී. කේ. ද සිල්වා සහ කේ. ඩී. ආර්. මාග්‍රට්.
ගිණුම් අංක : 0065 5000 0480

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් අට ලක්ෂ අසූ එක් දහස් නමසිය හැට දෙකයි ශත පනස් දෙකක (රු. 5,881,962.52) මුදල ද, 2020 සැප්තැම්බර් මස 09 වැනි දින සිට අංක 253 සහ 933 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate + Four Decimal Five per centum (4.5%) per annum (floor rate of 16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.23 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.10.14 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.12.11 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, මීනුවන්ගොඩ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මීනුවන්ගොඩ උතුර අංක 125/2 දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මැදමුල්ල ග්‍රාමයේ පිහිටි දිවුලපිටිය පාර, වරිපනම් අංක 122 දරන "කොස්ගහවත්ත සහ කොස්ගහවතුකැබැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඩී. එන්. සිරිරත්න යන අය විසින් සාදන ලද 2013 ඔක්තෝබර් මස 19 දාතම හා අංක 9208 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මීනුවන්ගොඩ දිවුලපිටිය ප්‍රධාන පාර (දිවුලපිටිය පාර) සහ දිවුලපිටිය පාර, වරිපනම් අංක 122A දරන නිලන්ත රොෂාන් විසින් හිමිකම් කියන ඉඩම නැගෙනහිරට : දිවුලපිටිය පාර, වරිපනම් අංක 122A දරන නිලන්ත රොෂාන් විසින් හිමිකම් කියන ඉඩම සහ දිවුලපිටිය පාර වරිපනම් අංක 124/34A දරන ඒ. ඒ. රංජනී විසින් හිමිකම් කියන ඉඩම, දකුණට : දිවුලපිටිය පාර, වරිපනම් අංක 124/34A දරන ඒ. ඒ. රංජනී විසින් හිමිකම් කියන ඉඩම සහ වසන්ත යාපා කේ. ස්වර්ණලතා ඩයස්, එස්. එච්. ඒ. සී. පී. සෙනරත් විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : දිවුලපිටිය පාර, වරිපනම් අංක 120A දරන වසන්ත යාපා කේ. ස්වර්ණලතා ඩයස් එස්. එච්. ඒ. සී. පී. සෙනරත් විසින් හිමිකම් කියන ඉඩම සහ මීනුවන්ගොඩ පාර (දිවුලපිටිය පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් නමයයි දශම දෙකයි අටක් (A:0, R:0, P:39.28) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 9208 දරන එකී පිඹුරට අනුව ය.

අංක 9208 දරන එකී පිඹුරේ නිරූපිත එකී ලොට් 1 වෙනත් අයුරකින් පහතින් විස්තර කොට ඇති මෙම ඉඩමේ නැවත මිනුමක් ද වන අංක 1027 දරන පිඹුරේ ලොට් 4හි නැවත මිනුමකි :

එකී මැදමුල්ල ග්‍රාමයේ පිහිටි දිවුලපිටිය පාර, වරිපනම් අංක 122 දරන "කොස්ගහවත්ත සහ කොස්ගහවතුකැබැල්ල" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ඒ. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 1975 අගෝස්තු 22 දාතම හා අංක 1917A දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, ඊසානට සහ නැගෙනහිරට : ඩී. එෆ්. ජයසේකර විසින් හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : වයි. ඩී. බුද්ධදාස විසින් හිමිකම් කියන ඉඩම සහ නිලමේ විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට : නිලමේ විසින් හිමිකම් කියන ඉඩම, වයඹට : මිනුවන්ගොඩ දිවුලපිටිය පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (A:0, R:1, P:0) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1917A දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව K 115/80 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-159

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ආර්. පී. චන්ද්‍රපෙරුමාරච්චි.
ගිණුම් අංක : 0148 5000 7218.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.11.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හතළිස් හතර ලක්ෂ හැත්තෑ පන් දහස් පන්සිය අනූ හතරයි ශත අසූ තුනක (රු. 14,475,594.83) මුදල ද, 2019 නොවැම්බර් මස 14 වැනි දින සිට අංක 129 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි තිස් පන් ලක්ෂ අනූ හතර දහස් විසි තුනයි ශත හැටක (රු. 13,594,023.60) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක (16.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.23 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.10.14 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.12.21 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, ගල්ඒදණ්ඩ, අංක 265A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගල් ඒදණ්ඩ ග්‍රාමයේ පිහිටි ගල්ඒදණ්ඩ පාර, වරිපනම් අංක 145A දරන "හල්ගහවත්ත සහ මීගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ඒ. කටුගම්පොල යන අය විසින් සාදන ලද 2001 අප්‍රේල් 11 දාතම හා අංක 50/2001 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් B1X වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ගල් ඒදණ්ඩ පාර, නැගෙනහිරට : ලොට් B1Y, දකුණට : අංක 8863 දරන පිඹුරේ ලොට් B2 සහ බස්නාහිරට : අංක 647 දරන පිඹුරේ ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් පහක් (A:0, R:0, P:35) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 50/2001 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව N 501/32 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11-160

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ආර්. පී. චන්ද්‍රපෙරුමාරච්චි.
ගිණුම් අංකය : 0148 5000 7218.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.11.28 දින සම්පත් බැංකුව පීඑල්සී

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන්කෝටි හැටඑක් ලක්ෂ අසූහත් දහස් නමසිය විස්සයි ශත පනස් නමයක (රු. 36,187,920.59) මුදල ද, 2019 නොවැම්බර් මස 14 වැනි දින සිට අංක 2736 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් තුන්කෝටි පනස් දෙලක්ෂ විසිහය දහස් හත්සිය තිස් හයයි ශත අසූ හයක (රු. 35,226,736.86) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.23 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.10.14 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.12.21 වැනි දින පෙ.ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අදිකාරී පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ මහර කඩවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ වේරගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ නුන්ගොමුගොඩ ග්‍රාමයේ පිහිටි පාසිහේන පාර වරිපනම් අංක 10 සහ 12 දරන ''දියපරගහවත්ත, ඇටඹගහවත්ත, හකුරුගේමුන්දෙණිය නොහොත් දෙල්ගහලන්ද, මිල්ලගහවත්ත සහ මාකේවිටගේ ක්‍රිස්ටියන් පෙරේරා විදානරාලගේවත්ත නොහොත් නැදුන්ගහවත්ත '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. එච්. ඒ. නිල්මිණි යන අය විසින් සාදන ලද 2018 මාර්තු මස 12 දාතම හා අංක 78/2018 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාසිහේන පාර, නැගෙනහිරට : ඩී. සී. පී. රාජසේකරගේ ඉඩම, දකුණට : දැනට පවත්නා මාර්ගය (අත්හැර දමන ලද) සහ බස්නාහිරට: ජයවර්ධනගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 38.78) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 78/2018 දරන එකී පිඹුරට අනුව ය.

එකී ලොට් 1 පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි :

එකී නුන්ගොමුගොඩ ග්‍රාමයේ පිහිටි ''දියපරගහවත්ත, ඇටඹගහවත්ත, හකුරුගේමුන්දෙණිය නොහොත් දෙල්ගහලන්ද, මිල්ලගහවත්ත සහ මාකේවිටගේ ක්‍රිස්ටියන් පෙරේරා විදානරාලගේවත්ත නොහොත් නැදුන්ගහවත්ත '' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ආර්. යූ. විජේතුංග යන අය විසින් සාදන ලද 2006 සැප්තැම්බර් මස 24 දාතම හා අංක 8997/2006 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: පාසිහේන පාර, නැගෙනහිරට : දැන් ඩී. සී. පී. රාජසේකරගේ අංක 14 දරන පරිශ්‍රයන් දකුණට : අඩි හයේ පළල දෙවට පාර සහ බස්නාහිරට : ජයවර්ධනගේ ඉඩම සහ දැන් එල්. ඩී. ඩී. වික්‍රමසිංහගේ ලොට් 8 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස් අටයි දශම හතයි අටක් (A:0, R:0, P:38.78)විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 8997/2006 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව G 224/118 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

11-161

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

දම්මික ගාමන්ට්ස්.
ගිණුම් අංකය : 0202 1000 2503.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තුන් කෝටි පනස් දෙලක්ෂ අනූ නම දහස් අටසිය තිහයි ශත හැට එකක (රු. 35,299,830.61) මුදල ද, 2020 සැප්තැම්බර් මස 08 වැනි දින සිට අංක 1898 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි හැත්තෑ හය ලක්ෂ හතළිස් හය දහස් පන්සිය පනස් හතයි ශත අනූ එකක (රු. 27,646,557.91) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%), රුපියල් හත් ලක්ෂ තිස් දෙදහස් අටසිය හැත්තෑ අටයි ශත එකක (රු. 732,878.01) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරයි දශම පහක් (14.5%) හා තවත් රුපියල් දහ නම ලක්ෂ හැත්තෑ එක් දහස් අටසිය හැට නමයයි ශත විසි එකක (රු. 1,971,869.21) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක්

(14%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2020.10.23 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2020.10.14 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.12.18 වැනි දින පෙ.ව. 10.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 87 දරන "චන්ද්‍රනගර්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 2, නැගෙනහිරට : ලොට් 11, දකුණට : එස්. ඇඩ්මන් සිංඤෝ විසින් හිමිකම් කියන දේපළ, බස්නාහිරට : ලොට් R1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 189/2003 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිුරුව B 1255/07 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 91 දරන "චන්ද්‍රනගර්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් R2, නැගෙනහිරට : ලොට් 11, දකුණට : ලොට් 1, බස්නාහිරට : ලොට් R1 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 189/2003 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිුරුව B 683/78 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

3. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ නවගමුව ග්‍රාමයේ පිහිටි සුමනතිස්ස මාවත, වරිපනම් අංක 85/41 දරන "චන්ද්‍රනගර්වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඩී. ඩබ්ලිව්. ඩී. පෙරේරා යන අය විසින් සාදන ලද 2003 නොවැම්බර් මස 19 දාතම හා අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 11 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් R2, නැගෙනහිරට : ලොට් 12, දකුණට : එම්. කේ. සිරිසේන හිමිකම් කියන ඉඩම සහ එස්. ඇඩ්මන් සිංඤෝ විසින් හිමිකම් කියන දේපළ, බස්නාහිරට : ලොට් 1 සහ 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0, R:0, P:10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 189/2003 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්‍රිුරුව B 810/21 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් R1 (අතුරුගිරිය පාර දිගේ වෙන් කිරීම), ලොට් R2 (මීටර 9 පළල පාර සඳහා වෙන් කිරීම) ලොට් R3, R4, R5 සහ R6 යන සියල්ල දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සහ එකී අංක 189/2003 දරන පිඹුරේ නිරූපිත ලොට් D1 සහ D2 වශයෙන් ලකුණු කොට ඇති කානුව භාවිතා කිරීමේ අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,

11-162

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | |
|---|---|---|
| | *රු.* | *ශ.* |
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සැහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2020 වර්ෂය** | | | |
| **නොවැම්බර්** | 2020.11.06 | සිකුරාදා | 2020.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.11.13 | සිකුරාදා | 2020.10.29 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2020.11.20 | සිකුරාදා | 2020.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.11.27 | සිකුරාදා | 2020.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2020.12.04 | සිකුරාදා | 2020.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.12.11 | සිකුරාදා | 2020.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.12.18 | සිකුරාදා | 2020.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2020.12.24 | බ්‍රහස්පතින්දා | 2020.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2021 වර්ෂය** | | | |
| **ජනවාරි** | 2021.01.01 | සිකුරාදා | 2020.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.08 | සිකුරාදා | 2020.12.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.01.15 | සිකුරාදා | 2021.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.22 | සිකුරාදා | 2021.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.29 | සිකුරාදා | 2021.01.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.